ව්‍යාපෘතියේ නම : දියගල ළමා නගරයේ (Boys' Town) ජීවවායු ජීරකයක් ඉදිකිරීම

විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය : ජා ඇල

දිස්ත්‍රික්කය : ගම්පහ

ව්‍යාපෘතිය ආරම්භ කල දිනය : 2018-01-29

ව්‍යාපෘතියේ මුළු පිරිවැය : රු. **1,290,240.50**

අමාත්‍යංශ දායකත්වය : රු. **903,169.75**

ව්‍යාපෘතියේ වර්තමාන ක්‍රියාත්මක තත්ත්වය :

අමාත්‍යංශය වෙත යොමු කරන ලද ව්‍යාපෘති යෝජනාවේ සඳහන් ආකාරයට ජීවවායු ඒකකයේඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් වී ඇත. ජීරකය සඳහා අමුද්‍රව්‍ය ඇතුළු කිරීම දෛනිකව සිදු කෙරෙන අතර ජීවවායු උත්පාදනය ක්‍රමානුකූලව සිදුවෙමින් පවතී.

ව්‍යාපෘතියේ අරමුණු කරා ළඟා වීමේ ප්‍රගතිය :

1. <u>සත්තව පාලනය තුළින් ඇතිවන පාරිසරික ගැටළු අවම කිරීම</u>
   දියගල ළමා නගරයේ ළමුන්ගේ දැනුම වර්ධනය හා මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සත්තව පාලන කටයුතු (ගව/සූකර) සිදු කෙරේ. දැනට ඌරන් 63 ක් පමණ ඇති කරනු ලබන අතර ඌරු කොටු ආශ්‍රිතව ජනනය වන අපද්‍රව්‍ය සියල්ල ජීවවායු ඒකකයට එකතු කරන බැවින්, එතෙක් පැවති පාරසරික ගැටළු බොහෝමයක් සඳහා (දුර්ගන්ධය/ අවට ජනතාවගෙන් මතුවූ පැමිණිලි /අපද්‍රව්‍ය ඉවත් කිරීමේදී මතු වූ ගැටළු ආදිය ) විසඳුම් ලබා ගැනීමේ හැකියාව ලැබී ඇත.
   ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූ කැලිකසළ කළමණාකරණය හා අපද්‍රව්‍ය ඵලදායි ලෙස බැහැර කිරීම සාර්ථකව සිදු වේ.

2. <u>කාබනික දියර පොහොර භාවිතයෙන් ගෙවතු වගාව සිදුකිරීම</u>
   දියගල ළමා නගරයේ ළමුන්ගේ පරිභෝජනය සඳහා මෙන්ම අතිරික්තය සහන මිලට විකුණා ආදායම් ලබා ගැනීමේ අරමුණින් ගෙවතු වගාව සිදු කරනු ලබයි . ජීව වායු ඒකකය ක් රියාත්මක කිරීමේදී එයින් පිටතට ගලා එන කාබනික දියර පොහොර මෙම වගා කටයුතු සඳහා භාවිතා කරයි. එබැවින් වස විසෙන් තොර කාබනික එළවළු හා පළතුරු නිෂ්පාදනය සඳහා මෙම ව්‍යාපෘතියෙන් දායකත්වය ලැබී ඇත.

3. <u>ජීව වායුව ප්‍රයෝජනයට ගැනීම</u>
   දෛනිකව උත්පාදනය වන ජීව වායුව දියගල ළමා නගරයේ සේවක නේවාසිකාගාර වල ඉවුම් පිහුම් කටයුතු සඳහා භාවිතා කරයි.

කේ. වයි. පී. දර්ශිකා
විද්‍යා හා තාක්ෂණ නිලධාරි
ජා ඇල





